Australian Government

Department of Health

**කෝවිඩ්-19 පැතිරීම අඩු කිරීමට උපකාර කිරීම සඳහා නව මෙවලම්**

COVIDSafe (කෝවිඩ්සේෆ්) යනු කෝවිඩ්-19 පැතිරීම අඩු කිරීමට උපකාර කිරීම සඳහා පරීක්ෂා කිරීම, යහපත් සනීපාරක්ෂාව සහ සමාජ දුරස්ථභාවය සමග සමගාමීව ඇති නව ඇප් (app) එකකි.

COVIDSafe ඇප් එක මුළුමනින්ම සෞඛ්‍යය හා සම්බන්ධවේ. මේ මගින් කොරෝනා වයිරස් ආසාදනයවුණු අයෙකු හා සම්බන්ධවුණු අය හට ඒ බව දැනුම්දීමේ ක්‍රියාවලිය කඩිනම් කර ඕස්ට්‍රේලියානුවන් ආරක්ෂාකාරීව තැබීමට උපකාර කරනු ඇත. ඔබ රෝගයට නිරාවරණයවුනි නම්, ප්‍රාන්ත සහ ටෙරිටරි රජයන්හි සෞඛ්‍යය නිලධාරීන් විසින් ඔබ හා සම්බන්ධවී පහත දේ සම්බන්ධයෙන් දැනුම්දෙනු ඇත:

- බැලිය යුතු දේවල්
- ඔබ නිරෝධායනයට ලක්විය යුතුද යන බව
- පරීක්ෂා කර ගනු ලබන්නේ කොහොමද, කවදාද සහ කොහේද යන්න, සහ
- ඔබව සහ ඔබගේ පවුලේ අයව ආරක්ෂා කර ගන්නා ආකාරය.

ඇප් එක ලබා ගැනීම නොමිළේ වන අතර ස්වේච්ඡාවෙන්වේ. ඔබගේ ඇප් ස්ටෝර්ස් වෙතින් COVIDSafe ලබාගත හැකිය. නමක්, දුරකථන අංකයක්, පෝස්කෝඩයක් සහ වයස් පරාසය ලබාදෙන ලෙස ඔබගෙන් ඉල්ලා සිටිනු ඇත. මෙම තොරතුරු ඉතා ආරක්ෂිත දත්ත ගබඩා පද්ධතියක (data storage system) තැන්පත්කර තබන අතර විමර්ශන සංකේතයක් (reference code) ජනනය කිරීමට උපයෝගී කර ගනු ඇත.

ඔබ දවසේ වැඩ කටයුතු කරන අතර ඔබගේ දුරකථනයේ පසුබිමේ මෙම ඇප් එක ක්‍රියාත්මකවේ. ඇප් එක භාවිතා කරන වෙනත් අයව සොයා ගැනීම සඳහා බ්ලූටූත් තාක්ෂණය භාවිතා කරනු ඇත. ඔබ හා සම්බන්ධවන ඇප් එක භාවිතා කරන අයගේ විමර්ශන සංකේතය සමග සම්බන්ධ වන දිනය, වේලාව, දුර සහ සම්බන්ධවන කාලය අරක්ෂාකාරීව සටහන් කර ගනී.

ඒ මගින් ස්ථානය සටහන් නොකරයි.

මෙම සම්බන්ධවන තොරතුරු සංකේත කර (encrypt) ඔබගේ දුරකථනයේ ඇප් එකෙහි ගබඩා කරනු ඇත. ඔබට වුවද ඒ සඳහා ප්‍රවේශ විය නොහැක.

සම්බන්ධවන තොරතුරු ඇප් එකෙහි ගබඩාකර තබන්නේ දින 21ක් සඳහා පමණි. මේ කාලය මගින් වයිරසයේ උපරිම බීජෞෂණ කාලය වන දින 14 සහ සක්‍රිය පරීක්ෂණ ප්‍රතිඵලයක් ලබාගැනීමට ගතවන කාලය සඳහා ඉඩකඩ ලබාදේ. ඇප් එකෙහි ඇති දින 21කට වඩා පැරණි දත්ත ස්වයංක්‍රීයව මකා දමනු ඇත.

ඔබට කෝවිඩ්-19 ඇති බවට හඳුනාගතහොත්, ප්‍රාන්ත සහ ටෙරිටරි රජයන්හි සෞඛ්‍යය නිලධාරීන් විසින් ඔබ මෑත කාලයේ සම්බන්ධවුණු සියළුම අය සම්බන්ධ තොරතුරු විමසනු ඇත. ඔබ මීටර 1.5 ක් ඇතුලත මිනිත්තු 15 ක් හෝ වැඩි කාලයක් සමීපව සම්බන්ධවුණු, ඇප් එක මගින් හසුකර ගන්නා ලද තොරතුරු සඳහා ඔවුනට ප්‍රවේශය ලබාදීමට තීරණය කල හැකිය.

දැනට, වයිරසයට නිරාවරණයවුණු අයව සොයා ගැනීම රඳා පවතින්නේ මිනිසුන් හට තමා අවට සිටි අයව මතකද යන්න සහ ඔවුන් හා සම්බන්ධවීමේ තොරතුරු දන්නේද යන පදනම මතවේ. COVIDSafe මගින් මෙම ක්‍රියාවලිය වඩා වේගවත් සහ වඩා නිවැරදිව සිදු කරනු ඇත.

මෙම ඇප් එකෙහි ඇති තොරතුරු උපයෝගි කරගත හැක්කේ ප්‍රාන්ත සහ ටෙරිටරි රජයන්හි සෞඛ්‍යය බලධාරීන් විසින් පමණක් වන අතර, කොරෝනා වයිරස් ආසාදනයවුණු අයෙකු හා සම්බන්ධවුණු අය හට දැනුම්දීම සඳහා පමණි. වෙන කිසිදු ආකාරයකට ඇප් එකෙහි ඇති දත්ත උපයෝගී කර ගැනීම අපරාධ වරදකි.

ඔබගේ දුරකථනයේ ඇති ඇප් එක හෝ එහි ඇති තොරතුරු ඕනෑම අවස්ථාවක ඔබ විසින් මකා දැමිය හැකිවේ.

ඕස්ට්‍රේලියාවේ මෙම වසංගතය අවසන්වීමෙන් පසු, සිය දුරකථනයෙන් COVIDSafe ඇප් එක ඉවත් කිරීමට එය භාවිතා කරන අයට සිහිපත් කිරීමක් කරනු ඇත. මේ මගින් යම් පුද්ගලයකුගේ දුරකථනයේ ඇති සියළුම ඇප් තොරතුරු මකා දමනු ඇත. වසංගතය අවසානයේ තොරතුරු ගබඩා පද්ධතියේ ඇති තොරතුරු සියල්ලද විනාශ කරනු ඇත.

ඇප් එක භාවිතා කිරීම මගින් පනවා ඇති සීමා වඩා ඉක්මණින් අඩු කිරීමට රජයන් හට උපකාරීවේ.

කොරෝනා වයිරස් සහ COVIDSafe ඇප් එක සම්බන්ධ වැඩිදුර විස්තර සඳහා www.health.gov.au වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.